මගේ අංකය : JSC/SEC/CIR/2020

**සියලුම මහේස්ත්‍රාත් අධිකරණ හා දිසා/මහේස්ත්‍රාත් අධිකරණවල සේවය කරන මහේස්ත්‍රාත්වරුන් හා අතිරේක මහේස්ත්‍රාත්වරුන් වෙත,**

**1999 අංක 46 දරණ ප්‍රජා පාදක විශෝධන පනත සම්බන්ධව**

ශීර්ෂගත කරුණට අදාලව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් ගරු අගවිනිසුරුතුමා වෙත යොමු කර ඇති MOJ/L13/JSC/2020 හා 2020.10.05 දිනැති ලිපිය මගින් "*බොහෝ මහේස්ත්‍රාත්වරුන් විසින් ප්‍රජා පාදක විශෝධන නියෝග ලබා දීමට මැලිකමක් දැක්වීම, දිවයින පුරා බන්ධනාගාරතුල තදබදය උග්‍රවීමට හේතුවක් වී ඇති බවට*" ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව උපුටා දක්වමින් සඳහන් කර ඇත.

02. ඉහත කී ලිපිය සහ ඊට අදාල ඇමුණුම් පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව ඔබගේ අධිකරණයට අදාලව,

i. ඉහත පරිදි වූ ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ස්ථාවරය සම්බන්ධයෙන් වූ ඔබගේ නිරීක්ෂණත්,
ii. සමස්ථයක් වශයෙන් ප්‍රජා පාදක විශෝධන පනත යටතේ වූ නියෝග නිකුත් කිරීම හා සබැඳිව යම් සීමාකාරී තත්ත්වයන් පවතින්නේ නම් ඊට හේතු සහ ඒ සම්බන්ධයෙන් වූ ඔබගේ නිරීක්ෂණත්,

<u>මෙම ලිපිය ලද දින සිට සති දෙකක් තුල</u> අධිරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා මා වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස ඔබට දැන්වීමට මට නියම කර ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2020 ඔක්තෝබර් මස 23 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.